**ඇමෙරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය**
**කොළඹ**
**මාධ්‍ය නිවේදනය**
**මහජන කටයුතු අංශය**
දු.ක.: +94 (1) 249-8100 ● ෆැක්ස්: +94 (1) 244-9070
ඊමේල්: VanHornNT@state.gov ● http://lk.usembassy.gov

# ශ්‍රී ලංකා සහ ඇමෙරිකා එක්සත් ජනපද රජයන් එක්ව YouLead! තරුණ රැකියා නියුක්ති වැඩසටහන අරඹයි.

නිවේදන අංකය. 20171019

**ඔක්තෝබර් 19 දින කොළඹ දී: ශ්‍රී ලංකා රජය සහ ඇමෙරිකා එක්සත් ජනපදය එක්ව** YouLead! මූලාරම්භය ඔක්තෝබර් මස 19 වන දින ආරම්භ කරන ලදී. ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ එක්සත් ජනපද නියෝජිතායතනය (USAID) විසින් රුපියල් බිලියන 1.8 ක් වැය කරනු ලබන මෙම වැඩසටහන තරුණයන්ගේ රැකියා නියුක්ති භාවය, වෘත්තීය කුසලතා සංවර්ධනය සහ ව්‍යවසායකත්වය ඉහළ දැමීම අරමුණු කොට ගත්තකි. කොළඹ ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ පැවැති සමාරම්භක උත්සවයේ ප්‍රධාන ආරාධිතයින් ලෙස ඇ.එ.ජ. තානාපති අතුල් කෙෂප් මහතා සහ අමාත්‍ය චන්දිම වීරක්කොඩි මහතා සහභාගි විය.

ශ්‍රී ලාංකික තරුණයින් හට තම වෙළඳපොල තුළ වඩාත් තරඟකාරී වීමට ඉදිරි වසර හතරක කාලය තුළ මෙම මූලාරම්භය ක්‍රියාවට නැංවීම සඳහා USAID ආයතනය, ශ්‍රී ලංකා රජයේ පාර්ශ්වකරුවන්, පෞද්ගලික අංශය, ලාභ නොලබන සංවිධාන සහ අධ්‍යාපන ආයතන අත්වැල් බැඳගනු ඇත. YouLead! ගෝලිය වශයෙන් වඩා යහපත් පරිචයන් සහ මෙවලම් එක් කරමින් වැඩි ඉල්ලුමක් සහිත රැකියාවන් සඳහා දොරටු විවර කරයි.

USAID ආයතනය විසින් මූල්‍යාධාර සපයන මෙම YouLead! මූලාරම්භය ආර්ථික වර්ධන සංධානය සඳහා වූ ස්වේච්ඡා සේවකයින් විසින් පරිපාලනය කරන අතර IESC ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබයි. IESC යනු 1965 වසරේ සිට ශ්‍රී ලංකාවේ පෞද්ගලික ව්‍යවසායයන් සිය ගණනක් සමග කටයුතු කොට ඇති සංවිධානයකි. YouLead!,යටතේ IESC ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය, ඇමෙරිකානු වාණිජ මණ්ඩලය, ඇරිසෝනා රාජ්‍ය විශ්ව විද්‍යාලය, ලෝක ප්‍රජාව, ස්කිල්ස් ෆෝ ලයිෆ් සහ වෙරිටේ සර්ච් යන ආයතන සමග හවුල්කාරිත්වයක් ගොඩ නගා ගනු ඇත.

## ඇමෙරිකානු තානාපති අතුල් කෙෂප් මහතා YouLead! සමාරම්භක උත්සවයේදී දැක්වූ අදහස්

නෝනාවරුනි, මහත්වරුනි, ඔබ සියළු දෙනා මුණගැසීමට ලැබීම සතුටක්. ගරු චන්දිම වීරක්කොඩි අමාත්‍යතුමනි, අද දින ඔබ අප හා එක්වීම අප හට මහත් ගෞරවයක්. මෙම වැදගත් උත්සවය සංවිධානය කිරීම පිළිබඳව වාණිජ මණ්ඩලයට මා ස්තුතිවන්ත වෙමි.

මිත්‍රවරුනි, මම අර වීඩියෝව නැරඹුවා. එහි සිටි තරුණ තරුණියන්ගේ අභිලාෂයන් සහ ප්‍රීතිමත් සහ තෘප්තිමත් ජීවිතයක් ගත කිරීමට ඔවුන්ගේ ඇති ඕනෑකම දැක මා ඉමහත් සතුටට පත් වුණා. මේ වන විට රැකියා වල නියුතු වියදම් කිරීම සඳහා අවශ්‍ය මුදල් අතේ ඇති අපට ඒ කාලය නැවත

සිහියට නගා ගැනීම අසීරු වන්නට පුළුවන්. අපගේ අනාගතය කෙසේ වේදැයි මීට දශක දෙක තුනකට කලින් මෙහි අද සිටින බොහෝ දෙනා දැන නොසිටින්නට ඇති. අපට රැකියාවක් ලැබේවිද ? පවුලක් ගොඩ නගා ගැනීමට හැකි වේද ? පොදු යහපත වෙනුවෙන් යමක් කිරීමට ඉඩ ලැබේ ද ? තෘප්තිමත් ජීවිතයක් ගත කිරීමට අවකාශ ලැබේද ? ආදී දහසකුත් එකක් ප්‍රශ්න එවකට අප සිත් තුළ තිබුණි.

ජීවිතයේ සතුට සහ සාර්ථකත්වය සඳහා අත්‍යවශ්‍ය වන්නා වූ සාධකයන් වන්නේ සුරක්ෂිත වාසස්ථානයක්, ප්‍රීතිමත් ගෘහයක්, ආදරණීය පවුලක් සහ තෘප්තිමත් විය හැකි ඵලදායී රැකියාවක් ආදියයි.

පසුගිය දශක කිහිපය තුළ ශ්‍රී ලංකාව බොහෝ දුක් කම්කටොලු සහ වේදනාවන් වින්දා. නමුත් දැන් වන විට ඒ අවාසනාවන්ත අතීතය, අතීතය බවටම පත්ව හමාරයි. අර වීඩියෝව නරඹමින් සිටින විට මා සිහියට නැගුණු කරුණ නම්, මේ සියළු තරුණ තරුණියන් හට සතුටින් පිරි පූර්ණ ජීවිතයක් ගත කිරීමට අවස්ථාව උදා වන්නේ නම් කොතරම් අගේද? කියායි. සිය විභවතාවයන් පූර්ණ වශයෙන් භාවිතයට ගත හැකි රැකියාවල නිරත වීමට තරුණ තරුණියන් හට අවකාශ ඇත්නම් ඉන් රටට අත්වන ප්‍රතිලාභය ඉමහත්ය.

තානාපති ලෙස මගේ ධූර කාලය තුළ මේ රටේ සෑම ප්‍රදේශයකටම පාහේ සංචාරය කරමින් විවිධ පුද්ගලයන් මුණ ගැසීමට මා හට වාසනාව උදා වුණි. මා මේ රට තුළ ගත කළ කාලයේ ඉතා ප්‍රීතිමත්ම මොහොතක් ලෙස මා මෙම අවස්ථාව දකිනවා. දශක කිහිපයක් තිස්සේ පැවති ගැටුම්කාරී, අසහනකාරී තත්ත්වය නිමා වී ඇති බැවින් දැන් ශ්‍රී ලංකාවට දීප්තිමත් අනාගතයක් ගැන බලාපොරොත්තු තැබිය හැකියි.

මිත්‍රවරුනි, මේ රටේ තරුණ තරුණියන්ගේ විභවතාවයන් සහ මානව කුසලතාවයන් සැබැවින්ම පුදුම එලවන සුළුයි. මේ රටේ තරුණ තරුණියන්ට ළඟා කොට හැකි දේවල් මෙන්ම රට වෙනුවෙන් ඔවුන් තුළ ඇති දැක්ම ප්‍රශස්තයි. ඇ.එ. තානාපතිවරයා ලෙසත් ඇමෙරිකාවේ සහ මෙහි සිටින ඇමෙරිකානු ජනතාවගේ නියෝජිතයා ලෙසත් මා ප්‍රකාශ කරන්නේ රට වෙනුවෙන් ශ්‍රී ලාංකිකයන් සතු දැක්ම උදක්ම ශ්‍රේෂ්ඨ බවයි. 2015 පැවති නිදහස් හා ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණයේදී ශ්‍රී ලාංකිකයන් සිය දැක්ම කුමක්ද යන්න ඉතා පැහැදිලි ලෙස ප්‍රකාශ කළා. එය ශ්‍රී ලංකා ඇමෙරිකානු සබඳතා ශක්තිමත් කිරීමට මගපාදනු ලැබුවා. එය ශ්‍රී ලංකාවේ පැවති වඩාත්ම හොඳ මැතිවරණය කියා කියන්නට හැකියි. මා එසේ ප්‍රකාශ කරන්නේ ඒ හරහා ඔබගේ ජනතාවට, ඔබගේ තරුණ තරුණියන් හට, ඔබගේ රජයට මෙන්ම ඔබගේ ජනාධිපතිවරයාට සහ අගමැතිවරයාට මෙම රට නිවැරදි දිශාවට රැගෙන යාමට අවස්ථාව උදා වී තිබෙනවා. ප්‍රජාතන්ත්‍රවාදය, සෞභාග්‍යය, සංහිඳියාව සහ සාමය ශ්‍රී ලංකාවට උදා වී තිබෙනවා වගේම මෙහි සිටින තරුණ තරුණියන් සඳහා වැඩි ඉඩප්‍රස්ථා නිර්මාණය වේ යැයි අපි අපේක්ෂාවෙන් සිටිනවා.

මිත්‍රවරුනි, ඇමෙරිකානු ජනතාව මෙම දැක්ම ගරු කරනවා සේම එය ඉතා ඉහළින් අගය කරනවා. ශ්‍රී ලංකාවේ ජනතාව සතු සිහින සහ අපේක්ෂාවන් යථාර්ථයන් බවට පත් කිරීම උදෙසා අපට දිය හැකි සෑම සහායක්ම ලබා දීමට අප නිරතුරුව ඇප කැප වී සිටිනවා. ඉහළ මට්ටමේ ඇමෙරිකානු නිලධාරීන් ශ්‍රී ලංකාවට කිහිප වතාවක් පැමිණ තිබෙනවා. විශේෂයෙන් ආචාර්ය සිසන් සහ ඔහුගේ කණ්ඩායම විසින් ශ්‍රී ලංකාව සහ ඇමෙරිකාව අතර දශක ගණනාවක් තිස්සේ පැවති දැඩි මිත්‍රත්වය තවත් තහවුරු කිරීම සඳහා අවශ්‍ය කටයුතුවල නිරත වෙනවා. සහශ්‍ර අභියෝග සංස්ථාව විසින් සිදුකරනු ලබන මෙහෙවර සහ විනිවිදභාවය සහ නීතිය හා සාමය තහවුරු කිරීම සඳහා වූ ව්‍යායාමයන් හරහා ශ්‍රී ලංකාවේ ණය සහ රාජ්‍ය මූල්‍යය හා සම්බන්ධ කටයුතු වලදී රජය සමග සමීපව කටයුතු කිරීමට අප කටයුතු කොට තිබෙනවා. එසේම මානුෂීය සහාය ලබා දීම සහ ආපදා සහන සැලසීම ආදී කටයුතු සම්බන්ධයෙන් ඔබගේ ආරක්ෂක හමුදා පුහුණු කිරීමට අපගේ තරුණ නාවිකයන් ඉදිරිපත් වී සිටිනවා. එපමණක් නොව මේ රට තුළ ඇති පාසල්, අනාථ නිවාස සහ වෙනත් පුණ්‍යායතන තුළ ස්වේච්ඡාවෙන් සිය සේවය සපයන්නට ඔවුන් ඉතා කැමැත්තෙන් ඉදිරියට විත් තිබෙනවා. ශ්‍රී ලාංකික ජනතාවගේ සාර්ථකත්වය අපගේ තිරසාර ප්‍රාර්ථනාවයි.

ඒ අනුව, මෙම වැදගත් අවස්ථාවේදී ඔබ මුණගැසී ඔබට අමතන්නට ලැබීම මා ලද භාග්‍යයක්. ඒ වගේම එය මට ඉමහත් සතුටක්. රටක අනාගතය එම රටේ තරුණ පිරිස බව මා මෙන්ම ඔබත් විශ්වාස කරන්නේ නම්, ගරු අමාත්‍ය චන්දිම වීරක්කොඩි මහතා ඉදිරියේ අප කරන්නා වූ මෙම කාර්යය සැබැවින්ම ආයෝජනයක්. ඔබගේ තරුණ පිරිස මේ රට තව තවත් ඉදිරියට ගෙන ගොස් ප්‍රීතිය සහ සෞභාග්‍යය වෙත අවතීර්ණ කරවන බව මට විශ්වාසයි.

ලොව පුරා තරුණ තරුණියන් බිලියන 1.5 ක් පමණ ජීවත් වන අතර ඔවුන් සිතන පතන ආකාරය සහ ඔවුන් රැකියා නියුක්තිගත වී ඇති ආකාරය හා ප්‍රමාණය අනාගත ලෝකයේ සාමය, ආරක්ෂාව සහ සෞභාග්‍යය කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇති කරනවා.

සංඛ්‍යා ලේඛනවලට අනුව ශ්‍රී ලංකාවේ රැකියා වියුක්ති පුද්ගලයින්ගෙන් 70% ක් වයස අවුරුදු 15-29 ත් අතර තරුණ තරුණියන් රැකියා නොමැති පිරිසෙන් 70% ක් තරුණ අයයි. වයස අවුරුදු 15-29 ත් අතර රැකියා වියුක්ති ජනගහනය, රැකියා වියුක්තියෙන් පෙලෙන අනෙක් පිරිස මෙන් නව ගුණයකි. සෑම වසරකම සිසුන් 278,000 ක් විශ්ව විද්‍යාල අධ්‍යාපනයට වරම් නොමැතිව පාසල් පද්ධතියෙන් ඉවත් වෙනවා. එම වයස් කාණ්ඩය තුළ සිටින ලක්ෂ පහකට ආසන්න තරුණ පිරිසක් රැකියා ලබා ගැනීමට නොහැකිව සිටින බව වාර්තා වෙනවා.

නමුත් සතුටට කරුණක් නම් ශ්‍රී ලංකාවේ ආර්ථිකය මේ වන විට වර්ධනය වෙමින් පැවතීමයි. සංචාරක කර්මාන්තය ප්‍රසාරණය වෙමින් පවතින අතර 2020 වන විට එම ක්ෂේත්‍රය තුළ රැකියා අවස්ථා ලක්ෂ තුනක් නිර්මාණය වන බව ගණන් බලා තිබෙනවා. ඉදිකිරීමේ ක්ෂේත්‍රය තුළ නව රැකියා අවස්ථා ලක්ෂ හතරක් පමණ ජනනය වේ යැයි ඇස්තමේන්තු කොට තිබෙනවා. ඇමෙරිකා එක්සත් ජනපදයද ඇතුළුව ලොව සියළු රටවල රැකියා නියුක්තියේ කේන්ද්‍රය වන්නේ පෞද්ගලික අංශයයි. මා දකින ආකාරයට ශ්‍රී ලංකාවේද තත්ත්වය එයයි. එබැවින් සංචාරක, ඉදිකිරීම්, සමුද්‍රීය සේවාවන් ආදී ක්ෂේත්‍ර තුළ සංසන්දනාත්මක වාසිය ඇත්තේ ඒ හේතුවෙනි. එකී ක්ෂේත්‍ර තුළ මෙන්ම තවත් බොහෝ ක්ෂේත්‍ර තුළ රැකියා ජනනය මුළුමනින්ම වාගේ පෞද්ගලික අංශය මගින් සිදු වේ.

තරුණයින් විසින් මුහුණ දෙන අභියෝග ගණනාවක් ඇති බව අප සියළු දෙනා විසින් පිලිගන්නා කරුණකි. තමන්ට හොඳ රැකියාවක් ලබා ගෙන නිවසක් තනා පවුලක් ලෙස සතුටින් ජීවත්වීමට හැකියාව ලැබේදැයි යන කනස්සල්ලෙන් බොහෝ තරුණ තරුණියන් පසු වේ. වේගයෙන් ස්වයංක්‍රීයකරණය වන ලොව තුළ රැකියා ජනනය ස්ථිර නොමැත. එසේ වුවත් ඔබට සැම විටම අවශ්‍ය වන්නා වූ කුසලතා රාශියක් තිබේ. ඒවායින් ඇතැම් කුසලතා සඳහා සා/පෙළ හෝ උ/පෙළ සුදුසුකම් අවශ්‍ය නොවේ. ඒවාට අවශ්‍ය වන්නේ හුදෙක් හැකියාව පමණි. තරුණ තරුණියනි, මාගේ ගෙදර වතුර බටයක් සකස් කර ගැනීමට තරම්වත් ප්‍රායෝගික තාක්ෂණික දැනුමක් මට නැත. නමුත් මේ කාමරයේ සිටින බොහෝ තරුණ තරුණියන් හට එම කුසලතාවන් තිබෙන බව මා දනිමි. එබැවින්, ජලනල කාර්මිකයෙකු අවශ්‍ය වු තැනට එම පුද්ගලයා නැතිවම බැරිය. එනම් ඒ අන්දමේ රැකියා අනාගතයට අත්‍යවශ්‍යය.

ඕනෑම ආර්ථිකයක ප්‍රගමනයට කුසලතා සපිරි පුද්ගලයින් අවශ්‍ය ය. මෙම වැඩසටහනේ හරයද එයයි. ඇමෙරිකා එක්සත් ජනපදය විශාල මුදල් ප්‍රමාණයක් මේ වෙනුවෙන් වැය කරන්නේ එහි ඇති වැදගත්කම හේතුවෙනි. එය ශ්‍රී ලාංකික ජනතාවගේ අනාගත සංතෘප්තිය වෙනුවෙන් සිදුකරනු ලබන වටිනා ආයෝජනයකි. එය ශ්‍රී ලංකාවේ සෞභාග්‍යය වෙනුවෙන් සිදු කරනු ලබන ආයෝජනයකි. ශ්‍රී ලංකාව ස්ථාවර, සෞභාග්‍යමත්, සංතෘප්ත සහ සාමකාමී රටක් වනු දැකීම අරමුණු කොට ගත් ආයෝජනයකි. රටක තරුණ පිරිස හට සිය විභවතාවයන් පූර්ණ වශයෙන් භාවිතයට ගෙන ඒ හරහා තෘප්තිමත් ජීවිතයක් ගත කිරීමට හැකි නම් එය එරටේ ආර්ථික අභිවෘද්ධියට මහත් පිටුබලයක් සපයයි.

USAID, ආයතනයේ එහි ව්‍යාපෘති පාර්ශ්වකරුවන්ගේ සහ ශ්‍රී ලංකා රජයේ අපේක්ෂාව වන්නේ වඩාත් වෙළඳපොල කේන්ද්‍රීය කුසලතා සපිරි සහ නම්‍යශීලී තරුණසේවා ස්ථානයක් නිර්මාණය කිරීම

සඳහා රුපියල් බිලියන 1.8 ක් හෙවත් ඇමෙරිකානු ඩොලර් මිලියන 12ක් ආයෝජනය කිරීමයි. You Lead! මූලාරම්භය විසින් රැකියා විරහිත තරුණ තරුණියන් වඩා යහපත් රැකියා සමග සම්බන්ධ කිරීම හෝ ස්වයං රැකියා අවස්ථා වෙත යොමු කිරීම සිදු කරනු ඇත. කුසලතා සංවර්ධනය, රැකියාස්ථ පුහුණුව, මාර්ගෝපදේශන සේවාවන් සහ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වයන් හරහා තරුණයන් හට තමන්ගේම ව්‍යාපාර ආරම්භ කිරීමට හෝ පවත්නා ව්‍යාපාර වැඩි දියුණු කර ගැනිමට අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබා ගැනීමට මෙමගින් ඉඩකඩ සැලසේ.

ඇමෙරිකානු එක්සත් ජනපදයේ අප දකින සුවිශේෂීම ලක්ෂණය වන්නේ එහි ඇති ව්‍යවසාය කේන්ද්‍රීය සංස්කෘතියයි. රජයේ හොඳ යැයි සම්මත රැකියාවක් කරමින් සිට ඉන් ඉවත්ව තමන්ගේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට කටයුතු කිරීම අපගේ සංස්කෘතිය තුළ අළුත් දෙයක් නොවේ. ස්ටීව් ජොබ්ස් නම් පුද්ගලයා සතුව කිසිවක් නොතිබුනු අතර තිබුනේ අදහසක් පමණි. පසුව ඔහු ලොව විශාලතම සමාගමක හිමිකරු බවට පත්විය. අද නිර්මාණශීලී අදහස් වල බලයෙන් බිලියනපතියන් වී ලොව වෙනස් කිරීමට තරම් ශක්තිමත් වූ චරිත ඇමෙරිකානු සමාජය තුළ කොපමණවත් ඇත. මෙවන් වූ විප්ලවයක් සඳහා අවශ්‍ය වන ප්‍රධානතම සාධකය ආත්ම විශ්වාසයයි. ආත්ම විශ්වාසය සහ යම් මුදල් ප්‍රමාණයක් එක්වූ කල විශ්මයදවන දේ සිදු වේ.

ෆේස් බුක්, මයික්‍රොසොෆ්ට් වැනි ලොව අග්‍රගණ්‍ය නිර්මාණ බිහිවුයේ විශ්ව විද්‍යාල උපාධි මත නොවේ. ඒවා හුදෙක් ආත්ම විශ්වාසය හා සබැඳි නිර්මාණශීලි අදහස් ක්‍රියාවට නැංවීමේ ප්‍රතිඵලය විය.

එබැවින් එවන් දැක්මක් යථාර්ථයක් බවට පත් කර ගැනීමට බාධා පමුණුවන්නා වූ ගැටළු සහ හිතීන් තුරන් කිරීමේ වැදගත්කම අප නැරඹූ වීඩියෝවෙන් පැහැදිලි විය.

මෙම වැඩසටහන හරහා පෞද්ගලික අංශයේද සහයෝගය සහිතව උපදේශන ශිල්පීන් 1200 ක් පමණ පුහුණු කිරීමටත්, ශ්‍රම වෙළඳපොල සාර්ථක ලෙස ජයගැනීම සඳහා තරුණ තරුණියන් 95,000 ක් පුහුණු කිරීමටත් අපේක්සාවෙන් සිටිමු.. ඉහළ වර්ධනයක් සහිත ක්ෂේත්‍රයන් ප්‍රමුඛගත කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශ පාර්ශ්වකරුවන් හා සමීපව කටයුතු කරමින් නව විෂය නිර්දේශය 50 ක් පමණ හඳුන්වාදීම ඊට සමගාමීව සිදු වනු ඇත. කාන්තාවන් සහ ග්‍රාමීය තරුණයින් සඳහා රැකියා අවස්ථා තහවුරු කිරීම සහ කාන්තාවන සහ පුරුෂයන් අතර පවතින ආදායම් විෂමතාවයන් අවම කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම YouLead! හි තවත් එක් සුවිශේෂී ඉලක්කයකි.

මිත්‍රවරුනි, මෙය අපට තනිවම කළ හැක්කක් නොවන බව මා දනිමි. මෙහිදීඅපට සංවර්ධන ක්‍රියාවලිය තුළ වසර 60 ක කාලයක් තිස්සේ අප සමග සමීපව කටයුතු කළ අයගේ හිතාදර මිත්‍ර ශ්‍රී ලංකා රජයේ සහාය අවශ්‍යය. එසේම අපගේ පාර්ශ්වකරු වන 'ආර්ථික සංවර්ධනය සඳහා වූ ස්වේච්ඡා සෙවකයෝ සංවිදානයේ සහාය අවශ්‍යය. මෙම ඉක්කය සාක්ෂාත් කර ගැනීම සඳහා සේවා විධායක බලකාය, නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍යාංශය, ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය, ඇමෙරිකානු වාණිජ මණ්ඩලය, පෞද්ගලික අංශය සහ බොහෝ ලාභ නොලබන සංවිධාන ආදි ආයතන ගණනාවක අප සමග ඉතා සමීපව කටයුතු කරන අතර මෙම වැඩසටහන දියත් කරන අද දිනයේදීඅප වෙත දක්වන්නා වු සහයෝගය සහ සුහදතාවය වෙනුවෙන් එම සංවිධාන සහ ආයතන සියල්ලටම මම මාගේ හෘදයාංගම ස්තුතිය පළ කර සිටින්නෙමි.

ඇමෙරිකානුවන් ලෙස අප මෙය සිදු කරන්නේ පූර්ණ වශයෙන්ම ශ්‍රී ලාංකික ජනතාවගේ සුභසිද්ධිය සඳහා පමණක්ම නොවේ. ශ්‍රී ලංකාව වැනි රටවල් මෙවන් වැඩසටහන් හරහා ප්‍රතිලාභ ලැබ සංවර්ධනය වී ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහයක් සහිත රටවල් වන විට ඇමෙරිකානු ජනතාවද එහි ප්‍රතිලාභ භුක්ති විඳී. එය මුළු මහත් විශ්වයේම සාමය හා ආරක්ෂාව ස්ථාපිත කිරීමට ඉවහල් වෙයි.

අද දින මෙම ස්ථානයට පැමිණි ඔබ සැමට ස්තූතියි. ගරු අමාත්‍යතුමනි, ඔබතුමාගේ සහභාගිත්වය අප ඉතාමත් දිරිගන්වන සුළුයි. මෙම උත්සවයේ සත්කාරක ලෙස කටයුතු කළ වාණිජ මණ්ඩලයටත් බෙහෙවින්ම ස්තූතියි.


HON. CHANDIMA WEERAKKODY
Aquafresh
HON. KARUNARATNE PARANAWITHANA







# # # #